# උපාධි ප්‍රදානෝත්සවය 2009



## විවිධ පීඨ මඟින් පවත්නු ලබන පශ්චාත් උපාධි පාඨමාලා

**කෘෂිකර්ම විද්‍යා පීඨය**
ස්භාවික සම්පත් කළමනාකරණය
කෘෂි ව්‍යාපාර කළමනාකරණය
පශු විද්‍යාව
ආහාර විද්‍යා හා තාක්‍ෂණය
තිරසාර පලිබෝධ පාලනය

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය (ඩිප්ලෝමා)
ප්‍රජා සංවර්ධනය (ඩිප්ලෝමා)
මනෝ විද්‍යාත්මක උපදේශනය (ඩිප්ලෝමා)

**කළමනාකරණ හා මූල්‍ය පීඨය**
ව්‍යාපාර පරිපාලනය

**විද්‍යා පීඨය**
අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්‍ෂණය
භෝග සංරක්‍ෂණය

ශාස්ත්‍රපති, විද්‍යාපති, දර්ශනපති හා දර්ශන විශාරද උපාධි සඳහා සිසුන්ට ලියාපදිංචි විය හැකි අතර, සෑම පීඨයකම ඒ සඳහා අවශ්‍ය පර්යේෂණ හා අනෙකුත් පහසුකම් ඇත. සියළුම පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා සඳහා දැනට සිසුහු 500ට වැඩි ප්‍රමාණයක් සිය අධ්‍යයන කටයුතුවල නිරත ව සිටිති.

විශ්වවිද්‍යාලයේ සෑම වර්ෂයක දී ම විද්‍යා සම්මන්ත්‍රණ පවත්වනු ලබන අතර පර්යේෂණ ප්‍රකාශන එළි දක්වනු ලබයි. මීට අමතර ව Ruhuna Journal of Science, Rohana සහ Tropical Agricultural Research and Extension (TARE) යන පර්යේෂණ වාර සඟරා එළි දැක්වීම ද සිදු කරනු ලබයි.

## විශ්වවිද්‍යාලය සතු වෙනත් පහසුකම්

### බාහිර උපාධි ඒකකය

අ.පො.සඃ (උ.පෙළ) සමත් වුවත් විශ්වවිද්‍යාලයට ඇතුළත් වී අභ්‍යන්තර ව උපාධි පාඨමාලා හැදෑරීමට වරම් අහිමි වූ තරුණ තරුණියන් බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කර ඔවුන්ට ශාස්ත්‍රවේදී සාමාන්‍ය බාහිර උපාධිය පිරිනැමීම මෙම ඒකකය මඟින් සිදු කරයි.

ආරම්භක වර්ෂයේ දී බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාංපදිංචි වූ සිසුන් සංඛ්‍යාව එක් දහස් පන්සියයක් පමණ වූ අතර දශකයක් ඇවෑමෙන් එහි ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව විසි පන්දහස ඉක්මවා ඇත. වාර්ෂික ව බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම හා පරීක්‍ෂණ පැවැත්වීම බාහිර විභාග ඒකකය මඟින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යය වේ. මොඩියුලර් සැපයීම හා විද්‍යුත් මාධ්‍ය තුළින් ඉගෙනීමේ හා ඉගැන්වීමේ අවස්ථාව සැපයීමට බාහිර විභාග ඒකකය මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය සමඟ අවශ්‍ය කටයුතු මේ වන විට සැලසුම් කරමින් සිටී. ලබන වසරේ සිට බාහිර උපධි පාඨමාලාව ද පාඨමාලා ඒකක ක්‍රමයට අනුගත කිරීමට දැනටමත් පීඨ මණ්ඩලය පියවර ගෙන ඇත.

### සංස්කෘතික කේන්ද්‍රය

රුහුණ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා කලා නිර්මාණයෙහි හා රසාස්වාදයෙහි යෙදීමටත් තම සහජ කුසලතා වර්ධනය කර ගැනිමටත් අවස්ථා උදාකිරිම මෙම කේන්ද්‍රය මඟින් සිදුකරයි. මෙමඟින් සිසුන්ගේ සංස්කෘතික දැනුම වර්ධනය සඳහා පෙරදිග අපරදිග නැටුම්, සංගීතය, සාහිත්‍ය නිර්මාණ, චිත්‍ර හා මූර්ති කලාව හා සිනමා විචාරය පිළිබඳ පාඨමලා පවත්වනු ලබන අතර සිසුන්ට හා ආචාර්ය මණ්ඩලයට සාහිත්‍ය, ජනසංගීතය, මානව විද්‍යාව පෞරානික චිත්‍ර හා අත්කම් පිළිබඳ පර්යේෂණ කිරීමට අවස්ථාව ලබාදීම සිදුකරයි.

### වෛද්‍ය මධ්‍යස්ථානය

ප්‍රධාන වශයෙන් වෛද්‍ය මධ්‍යස්ථානය රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම සංකිර්ණයේ පවත්වාගෙන යනු ලබන අතර වෛද්‍යවරු දෙදෙනෙක් හා අනෙකුත් කාර්ය මණ්ඩලය සේවය කරති. මෙම මධ්‍යස්ථානය මඟින් සිසුන්ට හා විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට නොමිලේ වෛද්‍ය පහසුකම් ලබාදීම, බෙහෙත් ලබාදීම, මුලික වෛද්‍ය පර්යේෂණ පහසුකම් ලබාදීම, මනොවිද්‍යාත්මක උපදේශනය, දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යෑම, ප්‍රථමාධාර පිළිබඳ සිසුන් දැනුවත් කිරිම, උත්සව හා ක්‍රීඩා කටයුතුවල දී අවශ්‍ය ප්‍රථමාධාර සැපයිම සිදුකරනු ලැබේ. මීට අමතර ව ආයුර්වේද කටයුතු දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් විශ්වවිද්‍යාලය තුළ ආයුර්වේද වෛද්‍ය මධස්ථානයක් ද පැවැත්වේ.

### වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

වර්ෂ 1998 දී වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය ස්ථාපනය කෙරුණු අතර එමඟින් සිසුන්ට රැකියා අවස්ථා ලබා ගැනීමට උපදෙස් දීම සිදුකෙරේ. එසේ ම රැකියා වෙළඳ පොළට අවශ්‍ය සිසුන්ගේ විෂය බාහිර කුසලතා වර්ධනය සඳහා දැනුම ලබාදීම හා ඒ සඳහා අවශ්‍ය වැඩමුළු සංවිධානය කිරීම සිදුකෙරේ. මෙම ඒකකය අචාර්ය මණ්ඩලයේ ප්‍රවීණ සාමාජිකයන්ගේ අධීක්‍ෂණය හා උපදේශකත්වය මත පවත්වාගෙන යනු ලැබේ.

### සේවා විද්‍යාගාරය

ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය දැනුම හා සේවාවන් ලබාදීමේ අරමුණින් වර්ෂ 2003 දී සේවා විද්‍යාගාරය ස්ථාපනය කෙරුණු අතර රුහුණ විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයන අංශය මඟින් අවශ්‍ය සේවාවන් සිදුකරනු ලැබේ.

### ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය

රුහුණ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය වර්ෂ 2005 දී ස්ථාපනය කෙරුණු අතර මෙම කාලය තුළ ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය මඟින් විදේශ විශ්වවිද්‍යා සමඟ අවබෝධතා ගිවිසුම් රාශියක් අත්සන් කර ඇති අතර එමඟින් සිසුන්ට හා විශ්වවිද්‍යාලයේ අචායයී මණ්ඩලයේ සාමාජිකයන්ට උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාව ලැබී ඇත.

### ශාරීරික අධ්‍යාපන අංශය



ශාරීරික හා මානසික වශයෙන් සමබර පෞරුෂයකින් යුත් හොඳ නායකත්ව ගුණාංගවලින් මෙන් ම සාධාරණ තීරණ ලබාදිය හැකි, නීති ගරුක සමාජයට වැඩදායි උපාධිධරයකු බිහිකිරීම අරමුණු කරගෙන මෙම අංශය පිහිටුවා ඇත. මෙහි මූලික පියවර වශයෙන් විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා ඉසව් 19ක් සඳහා පහසුකම් ලබාදෙමින් පුහුණු කටයුතු සංවිධානය කරන අතර අන්තර් පීඨ, අන්තර් විශ්වවිද්‍යාල, ඒකාබද්ධ විශ්වවිද්‍යාල හා ලෝක විශ්වවිද්‍යාල තරග සඳහා සිසුන්ගේ සහභාගීත්වය වර්ධනය කරනු ලබයි. මෙම අංශය යටතේ ඉතා අනර්ඝ තත්වයේ ගෘහස්ත ක්‍රීඩාගාරයක්, මීටර් 400 ධාවන පථයක් සහිත ක්‍රීඩා පිටියක් හා ශරීරයේ සියලු ම කොටස්වලට ව්‍යායාම් ලබාදිය හැකි කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලැබේ. මෙහි දී විශේෂ කුසලතා දක්වන සිසුන් වෙනුවෙන් පැවැත්වෙන වර්ණ ප්‍රදාන උළෙලේ දී විශ්වවිද්‍යාල වර්ණ ලබාදීම සිදුකෙරේ.මෙයට අමතර ව සිසුන් සඳහා වෛකල්පිත විෂයයක් වශයෙන් "ශාරීරික යෝග්‍යතාව හා සෞඛ්‍ය කළමනාකරණය" පාඨමාලාවක් පවත්වනු ලැබේ.

### නූතන භාෂා හා ශිෂ්ටාචාර මධ්‍යස්ථානය

රුහුණ විශ්වවිද්‍යාලය මඟින් පවත්වා ගෙන යන මෙම මධ්‍යස්ථානයෙන් **අභ්‍යන්තර හා බාහිර ශිෂ්‍ය භාෂා** පාඨමාලා ඉදිරිපත් කෙරේ.

අභ්‍යන්තර සිසුන් සඳහා දෙමළ, ජපන්, කොරියන්, ප්‍රංශ, ජර්මන් හා හින්දි යන භාෂාවන් උගන්වන අතර **බාහිර සිසුන් සඳහා දෙමළ භාෂා ප්‍රවීණතා සහතික පත්‍ර පාඨමාලාවක්** පැවැත්වේ. ජපන් භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ කිරීමට ද කටයුතු සංවිධානය කර ඇත.

### පුස්තකාල පහසුකම්

සෑම පීඨයක ම පුස්තකාල පහසුකම් ඇති අතර ප්‍රධාන පුස්තකාලය වැල්ලමඩම සංකීර්ණය තුළ පිහිටා ඇත. අධ්‍යයන හා පර්යෙෂණ කටයුතුවලට පුස්තකාලය ඉටු කරන කාර්යය ඉමහත් ය.

පුස්තකාලය මඟින් ඉටුකරන ප්‍රධාන කාර්යභාරයන් අතරින්, මහාචාර්ය අලවත්තාගොඩ පේමදාස පොත් හා ලිපි එකතුව, රෝහණ එකතුව, රුහුණ විශ්වවිද්‍යාල එකතුව යන තොරතුරු ගබඩා කිරීම, ISIS මෘදුකාංගය භාවිතා කරමින් පරිගණකගත කිරීම, බහු මාධ්‍ය ඒකකය ආරම්භ කිරීම, පුස්තකාල ශ්‍රවණාගාරය ස්ථාපිත කිරීම, නව කියවීම් ශාලාව ස්ථාපිත කිරීම, පුස්තකාල වෙබ් අඩවිය විවෘත කිරීම, ඉංජිනේරු පීඨ පුස්තකාලය ඇරඹීම, විශ්වවිද්‍යාලයයීය ලේඛනාගාරය ඇරඹීම, ඉසුරු (ISURU) මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම, බාහිර පුස්තකාල (පාසල්, මහජන පුස්තකාල) සඳහා සම්පත් දායකත්ව සැපයීම, කෘෂිකර්ම, වෛද්‍ය විද්‍යාල, ඉංජිනේරු පීඨ මාර්ගත සුචියට (OPAC) සම්බන්ධ කිරීම, වැඩමුළු සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා බැහැරදීම් සේවා ස්වයංක්‍රිය කරණය කිරීම සඳහන් කළ හැකි ය.

### නේවාසිකාගර පහසුකම්



විශ්වවිද්‍යාලය සතුව ස්ථිර නේවාසිකාගාර 32ක් පවතින අතර එමඟින් සිසු සිසුවියන් 3134ට පමණ නේවාසික පහසුකම් සපයා ඇත. මීට අමතර ව තවත් 400ක පමණ ධාරිතාවකින් යුතු නව නේවාසිකාගාර සංකීර්ණයක් ඉදිවෙමින් පවතී.

### වෙනත් පහසුකම්

විවිධ පහසුකම් යටතේ විශ්වවිද්‍යාලය මඟින් ආපන ශාලා, ශිෂ්‍ය පොදු කාමර, පරිගණක විද්‍යාගාර, අන්තර්ජාල පහසුකම්, උපදේශන ම්‍යස්ථාන හා ආරක්‍ෂක පහසුකම් සැපයීම සිදු කරයි.

### ශිෂ්‍ය හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විකාශනය







**රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, ශ්‍රී ලංකාව**